# <u>ව්‍යාපාරනාම ලියාපදිංචි කිරීම</u>

## <u>ක්‍රියාත්මක වන ආකාරය</u>

01. ඉල්ලුම්කරුවෙකු විසින් තම ව්‍යාපාරයේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කර දෙන ලෙසට කරනු ලබන ඉල්ලීමකට අනුව, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අප වෙත ලිපියක් යොමු කෙරේ. එම ලිපිය සමඟ එකී ව්‍යාපාරයට අදාළ ලියකියවිලිවල පිටපත් ද යොමු කිරීම අනිවාර්යය වේ.

- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමට අදාළව යොමු කර ඇති ලිපිලේඛන පරීක්ෂා කිරීම හා නියමිත නිර්ණායකයන්ට අනුකූලව ලිපිලේඛන තිබේදැයි පරීක්ෂා කිරීම මෙහි දී සිදු කෙරේ.

**<u>පොදුවේ අවශ්‍ය වන ලියකියවිලි පහතින් දැක්වේ.</u>**

i. අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් යොමු කර ඇති ලිපිය
ii. ජාතික හැඳුනුම්පතේ පිටපතක්
iii. ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ලිපිය
iv. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය (ව්‍යා.නා.ලි. 1වැනි ආකෘති පත්‍රය)
v. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය
vi. ප්‍රාදේශීය සභාවට ව්‍යාපාර බදු ගෙවූ රිසිට් පත
vii. ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා විරෝධතාවයක් නොමැති බවට වන ලිපිය
viii. පොලිස් සහතිකය
ix. ව්‍යාපාර ස්ථානයේ ඔප්පුව
x. පත්ඉරුව (ඇත්නම්)
xi. සම්බන්ධ වීම සඳහා දුරකථන අංකය ( **අත්‍යාවශ්‍ය වේ**)
xii. ව්‍යාපාරයේ ස්වභාවය අනුව, පරිසර බලපත්‍රය
xiii. **ව්‍යාපාරය සඳහා වාහන යොද වන්නේ නම්,**
    - ආදායම් බලපත්‍රයේ පිටපතක්
    - වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකය
    - වාහනයේ යෝග්‍යතාවය පිළිබඳ සහතිකයක් / පිළිගත හැකි ලියවිල්ලක්
    - රියදුරු බලපත්‍රය
xiv. **ඉන්ධන අලෙවි ස්ථානයක් නම්,**
    - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු ලිපිය
    - ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් නිකුත් කරන ලද ලිපිය
    - පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

02. උක්ත සඳහන් පරිදි **අදාළ ලියකියවිලි සම්පූර්ණ කර ඇත්නම්,** ව්‍යාපාරයේ ස්ථානීය පරීක්ෂණය සිදු කෙරේ. එහි දී, පහත සඳහන් නිර්ණායකවලට අනුව, අදාළ ව්‍යාපාරය සිදු කරනු ලබන්නේ නම් පමණක්, එම ව්‍යාපාරයේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සුදුසු බවට නිර්දේශ කරනු ලැබේ.

i. ව්‍යාපාරික ස්ථානය පැහැදිලිව ප්‍රදර්ශනය වන පරිදි පුවරුවක් සවි කර තිබිය යුතුය.
ii. ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යාමේ දී හා සේවාවන් සැලසීමේ දී පොදු මාර්ගවල ගමනා ගමනයට හෝ පුද්ගලයින්ට බාධා නොවන පරිදි පවත්වාගෙන යා යුතු ය.
iii. ව්‍යාපාරික ස්ථානය විවෘතව තබන දින හා වේලාවන් ප්‍රදර්ශනය වන පරිදි තබා තිබිය යුතු ය.
iv. මහජනයාට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි කාර්යාලයක් පවත්වාගෙන යා යුතු ය.
v. කාර්යාලයේ දුරකථන අංක සහ ෆැක්ස් අංක පැහැදිලිව ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.
vi. අයකරනු ලබන ගාස්තු පැහැදිලිව ප්‍රදර්ශනය කර ඇත.(ව්‍යාපාරයේ ස්වභාවය අනුව ඉදිරිපත් කල යුතු ය)

**කුලී රථ සේවාවන්ට අදාළ ව්‍යාපාරයක් නම්,** ඉහත සඳහන් අංක i සිට vi දක්වා කරුණු ඇතුළත්ව පහත සඳහන් නිර්ණායක ද සපුරා තිබිය යුතු ය.

- සේවාවල යොදවන සියළු වාහන පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.
- සේවාවල යොදවන වාහනවල රියදුරන් ඉහළම යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.
- සේවාවල යොදවන සියළු වාහනවල යෝග්‍යතාවය පිළිබඳ සහතික විය යුතුය.
- මෙහි සේවාවල යෙදෙන රියදුරන්ගේ පොලිස් වාර්තා පිටපත් ඉදිරිපත් කර තිබිය යුතුය.
- සේවාලාභියා විසින් ඇනුවුම් කරනු ලබන වාහනය පිළිබඳ සහතික විය යුතුය.
- ගමනක් යෙදෙන අතරවාරයේ අනතුරක් හෝ කාර්මික දෝෂයකට ලක්වන වාහන සඳහා නව වාහනයක් සැපයීම වැනි විකල්ප වැඩපිළිවෙළක් සකස් කර තිබිය යුතු ය.
- මාස 03කට එක් වතාවක්වත් සේවාවල යෙදෙන වාහන ගෙන්වා පරීක්ෂා කල යුතු අතර, අඩුපාඩු ඇත්නම්, ඒවා සකස් ක ගැනීමට රියදුරන් දැනුවත් කල යුතු අතර, එතෙක් එම වාහන සේවාවල නොයෙදිය යුතු ය.
- මහජන පැමිණිලි වාර්තාවන, අඩුපාඩු සහිතව වාහන නිතර නිතර සේවාවල යොදවන ආයතනවල බලපත්‍රය අහෝසි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කිරීමට සිදු වන බවට දැනුවත් වීම.

03. අදාළ ව්‍යාපාරය නියමිත නිර්ණායකයන්ට අනුව පවත්වාගෙන යනු ලබන බවට ස්ථානීය පරීක්ෂණයට අනුව තහවුරු වීමෙන් පසුව, අදාළ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සුදුසු බව නිර්දේශ කර, ඉල්ලුම්කරුට පිටපත් සහිතව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලිඛිතව දන්වනු ලැබේ.